ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.	ඔබේ අංකය / உமது இல. / Your No.	දිනය / திகதி / Date 2020.10.06

සී. රවීන්ද්‍ර සම්පත් චාර්ලිස් මහතා,
අංක 555, තුලාන, ලබුනෝරුව,
මරදන්කඩවල.

පැමිණිලි පාර්ශවය

පොලිස් පරීක්ෂක යූ. මහින්ද ගුණරත්න මහතා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
මොරගොඩ

වගඋත්තර පාර්ශවය

පැමිණිලි අංකය: HRC/AP/148/2019

පැමිණිල්ල මගින් ඉදිරිපත් කර ඇති කරුණු

පැමිණිලිකරු විසින් 2019.04.20වන දින පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශකර ඇත්තේ, 2019.03.18 වන දින රාත්‍රියේ තමා නිවසේ සිටියදී මොරගොඩ පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරීන් පිරිසක් තම නිවසට පැමිණ, සහකාර පොලිස් අධිකාරීවරයා පොලිස් ස්ථානය වෙත පැමිණ ඇති බවත්, තමන්ගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට අවශ්‍ය බවත් පවසා තමන්ව මොරගොඩ පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවයි.

තවද, පොලිසියට රුගෙන ගොස් තමන්ට එරෙහිව ව්‍යාජ ගව සොරකමක් පිළිබඳව චෝදනා ඉදිරිපත් කර නඩු පවරා ඇති බවත්, එමගින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකරු ඉදිරිපත් කර ඇති කරුණු

පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු දක්වමින් මොරගොඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් 2019.05.01 දිනැති හා අංක MO/OW/1057/2019 දරන වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එම වාර්තාව අනුව, 2019.03.16 වන දින රු.160,000.00ක් පමණ වටිනා එළ ගවයින් තිදෙනෙකු සොරකම් කිරීම සම්බන්ධයෙන් චාර්ලිස්ගේ නිමන්ත සඳරුවන් යන අය විසින් මොරගොඩ පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, ඉන් අනතුරුව, 2019.03.17 වන දින එම පුද්ගලයා විසින් නැවත ප්‍රකාශයක් ලබා දෙමින්, තමා විසින් "නිමිත්තක්" බලන ලද බවද ඒ අනුව තම සහෝදරයා වන

පැමිණිලිකරු විසින් අදාළ ගව සොරකම සිදුකර ඇති බවට සැකයක් පවතින බව ප්‍රකාශ කර ඇති බව ද වගඋත්තරකරු විසින් දක්වා ඇත.

ඒ අනුව සිදුකරන ලද විමර්ශනයේදී පැමිණිලිකරු සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය වූ බවත්, පැමිණිලිකරුගේ නිවසේදී 2019.03.19 වන දින පැය 00.30ට පමණ වරද සම්බන්ධයෙන් කරුණු දන්වා ඔහුව අත්අඩංගුවට ගත් බවත් වගඋත්තරකරු විසින් දක්වා ඇත. තවද, අදාළ විමර්ශනයේදී ප්‍රදේශවාසීන්ගෙන්ද පැමිණිලිකරු සම්බන්ධයෙන් තොරතුරු ලැබී ඇති බව වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

2019.05.24 වන දින, වගඋත්තරකරුගේ වාර්තාවට අදාළව තවදුරටත් පැමිණිලි පාර්ශවය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කර ඇති අතර, එකී ලිපියේ පහත කරුණු දක්වා ඇත.

මෙම සොරකමට සම්බන්ධ පුද්ගලයන් 6දෙනෙකු දිස්ත්‍රික් දූෂණ මර්ධන ඒකකය මගින් අත්අඩංගුවට ගෙන නඩු අංක B/315/2019 යටතේ කැකිරාව දිසා මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති බවද එහිදී ඔවුන් වරද පිළිගෙන ඇති බව ද එකී ලිපියේ සදහන් වේ. එසේම පොලිස් අධිකාරීවරයාගේ නියෝග මත කොට්ඨාශ අපරාධ අංශය මගින් එකී පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනය සිදු කළ බව ද එකී B වාර්තාවේ දැක්වේ.

අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති විසින් 2019.05.14 දිනැතිව අධිකරණයට ඉදිරිපත් කර ඇති B වාර්තාවේ දැක්වෙන්නේ මෙම පැමිණිල්ලට අදාළව සැකකරුවන් 05 දෙනෙකු සහ ලොරි රථයක් අත්අඩංගුවට ගත් බවත් එම සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කරන බවත් වන අතර මොරගොඩ පොලිස් ස්ථානය විසින් ඉදිරිපත් කර ඇති චාර්ල්ස්ගේ රවීන්ද්‍ර සම්පත් චාර්ල්ස් යන අය සම්බන්ධයෙන් තොරතුරු අණාවරණය නොවන බවද විශේෂයෙන් එහි සදහන් වේ.

නිරීක්ෂණ

කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල, වගඋත්තරකරුගේ වාර්තාව, විමර්ශන සටහන් සහ අදාළ ලේඛන පරීක්ෂා කිරීමේදී, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය වේ.

2019.03.16 දින එළ ගවයින් තිදෙනෙකු සොරකම් කිරීම සම්බන්ධයෙන් ලැබුණු මුල් පැමිණිල්ලෙන් අනතුරුව, පැමිණිලිකරුගේ සහෝදරයා විසින් 2019.03.17 දින ලබාදුන් ප්‍රකාශයක් මත පැමිණිලිකරු සම්බන්ධයෙන් සැකයක් මතුවී ඇති බව වගඋත්තරකරුගේ වාර්තාවෙන් ප්‍රකාශ කරයි. එම අවස්ථාවේදී පැමිණිලිකරු එම වරද සිදුකළ බවට සෘජු සාක්ෂියක් හෝ ඔහු එම වරදට සම්බන්ධ බව තහවුරු කරන වෙනත් නිශ්චිත කරුණක් අනාවරණය කරගෙන තිබූ බවට ලේඛනගත සාක්ෂි කිසිවක් ඉදිරිපත් කොට නොමැත.

වගඋත්තරකරු විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට පෙර සිදුකළ විමර්ශනයේදී ප්‍රදේශවාසීන්ගෙන්ද තොරතුරු ලබාගත් බව සඳහන් කර ඇත. එහෙත්, එම තොරතුරු පිළිබඳ සටහන් යෙදීමක් හෝ ඔවුන් විසින් ලබාදුන් තොරතුරු මොනවාද සහ එම තොරතුරු පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට ප්‍රමාණවත් සාධාරණ සැකයක් ඇති කිරීමට කෙසේ දායක වූයේ ද යන්න වගඋත්තරකරුවන් විසින් එවා ඇති විමර්ශන සටහන් හෝ ලේඛන මඟින් අනාවරණය කර නොමැත. මේ අනුව, අත්අඩංගුවට ගැනීමට විධිමත් විමර්ශනයක් සිදුකර නොමැති බව ද ඒ සඳහා ප්‍රමාණවත් සාක්ෂි නොමැති බව ද නිරීක්ෂණය වේ.

තවද, පැමිණිලිකරුට එරෙහිව මීට පෙර ද ගව සොරකමක් සම්බන්ධයෙන් නඩුවක් පැවති බව වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත. කෙසේ වෙතත්, එම පෙර නඩුව පැවතීම සහ වර්තමාන ගව සොරකම අතර සම්බන්ධතාවයක් ඇති බවට හෝ එම පෙර නඩුව හේතුවෙන් වර්තමාන සිද්ධිය සම්බන්ධයෙන් පැමිණිලිකරුට එරෙහිව සාධාරණ සැකයක් තහවුරු වන බවට කිසිදු නිශ්චිත කරුණක් ඉදිරිපත් වී නොමැත. එබැවින්, පුද්ගලයෙකුට එරෙහිව මීට පෙර නඩුවක් පැවතීම පමණක් පසුව සිදුවූ වෙනත් වරදක් සම්බන්ධයෙන් ඔහු අත්අඩංගුවට ගැනීම සාධාරණීකරණය කිරීමට ප්‍රමාණවත් නොවන බව ද නිරීක්ෂණය වේ.

මෙහිදී තවදුරටත් අවධානයට ගත යුතු කරුණක් වන්නේ, පැමිණිලිකරුට එරෙහිව පවරා තිබූ නඩුවෙන් 2019.07.01 දින ඔහු මුදාහැර ඇති බවට පැමිණිලිකරු විසින් කරුණු දක්වා තිබීමයි. එසේම, පසුව සිදුකරන ලද විමර්ශනයකදී අදාළ ගව සොරකම සම්බන්ධයෙන් වෙනත් සැකකරුවන් හඳුනාගෙන අත්අඩංගුවට ගත් බවද පැමිණිලිකරු සඳහන් කර ඇත. එම කරුණ වැඩිදුර විමර්ශනයෙන් පසුව ඉදිරිපත් කළ කොට්ඨාශ අපරාධ අංශයේ 2019.05.14 දිනැති B වාර්තාවෙන්ද පැහැදිලි වේ. මෙම පසුකාලීන තත්ත්වයන් මගින් ද පැමිණිලිකරු අත්අඩංගුවට ගත් අවස්ථාවේ ඔහුට එරෙහිව ප්‍රමාණවත් කරුණු පැවති බවක් අනාවරණය නොවේ.

ඒ අනුව, ඉදිරිපත් කර ඇති ලේඛනවලින් පෙනී යන්නේ, පැමිණිලිකරු සම්බන්ධයෙන් මුලින් මතු වූවා යැයි ප්‍රකාශ කරන සැකය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් විමර්ශනයක් සිදුකර නොතිබූ බවයි. විශේෂයෙන්ම, වගඋත්තරකරු විසින් ප්‍රදේශවාසීන්ගේ තොරතුරු ලැබූ බවට ප්‍රකාශ කළ ද, එවැනි ප්‍රකාශ කිසිවක් ඉදිරිපත් නොකිරීම සහ පැමිණිලිකරුට එරෙහිව මෙම සොරකමට අදාළ වෙනත් කිසිදු සාක්ෂියක් පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට පෙර අනාවරණය කරගෙන නොතිබූ බව පැහැදිලිව පෙනී යන කරුණකි.

මේ අනුව අත්අඩංගුවට ගැනීමට පෙර පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට ප්‍රමාණවත් කිසිදු විමර්ශනයක් හෝ විමර්ශනයකින් අනාවරණය කර ගත් කරුණු හෝ වගඋත්තර පාර්ශවය ඉදිරිපත් කොට නැත.

නිගමනය

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති, නීතියෙන් නියම කර ඇති ක්‍රියාපටිපාටියට අනුකූලව මිස කිසිදු තැනැත්තෙකු අත්අඩංගුවට නොගත යුතුය යන මූලික අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ. ඒ අනුව,

නිර්දේශය

1. පළමු වගඋත්තරකරුවන පොලිස් ස්ථානාධිපති යූ. මහින්ද ගුණරත්න විසින් රු. 5000/- ක මුදලක් පැමිණිලිකරුට ගෙවිය යුතු වේ.

2. පළමු වගඋත්තරකරුවන පොලිස් ස්ථානාධිපති යූ. මහින්ද ගුණරත්න සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගත යුතු වේ.

2026. 4 . 12 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7)වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුල කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්. ටී. බී. දෙහිදෙණිය.
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් : 01. අමාත්‍යතුමා, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - දැන ගැනීම සඳහා

02. ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - අවශ්‍ය කටයුතු සඳහා

03. පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ 02. - අවශ්‍ය කටයුතු සඳහා

04. සභාපති, ජාතික පොලිස් කොමිෂන් සභාව, බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07. - අවශ්‍ය කටයුතු සඳහා

05. ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරී, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, ප්‍රාදේශීය කාර්යාලය, අනුරාධපුර. - දැන ගැනීම සඳහා

සැ.යු. - අදාළ "මුදල මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.